# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1790/12 – 2012 දෙසැම්බර් 26 වැනි බදාදා – 2012.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි පල්ලෙසිය පත්තුව සුළු කොට්ඨාසයේ, ගලලියද්ද ගමේ පිහිටි මාතලේ දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/YTT/2006/325 හා 2007.02.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර "A" වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0712ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අක්ෂර "A" – වතුයායවත්ත ඉඩම – ප්‍රමාණය: **හෙක්. 0.0712ක් පමණ**

උතුරට: මාර්ගය සහ ආර්. කේ. ද සිල්වා හිමිකම් කියන වතුයායවත්ත; නැගෙනහිරට: ආර්. කේ. ද සිල්වා හිමිකම් කියන වතුයායවත්ත; දකුණට සහ බටහිරට: මාර්ගය සහ ආර්. ඒ. ද සිල්වා හිමිකම් කියන වතුයායවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: LD/05/2004/PC/105,
2012 නොවැම්බර් මස 20 වැනි දින,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 360

1A – G 17068 – 350 (2012/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.